# Path to Success - Study Pack

## 2021 දෙවන පාසල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල

## බුද්ධ ධර්මය - 9 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

## උපදේශනය හා අධීක්ෂණය

පී.ඩී. ඉරෝෂනී කේ. පරණගම මිය

(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ)

## මෙහෙයවීම හා සංවිධානය

එෆ්.එච්.ජේ.පී. සිල්වා මයා

(නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - සංවර්ධන)

## විෂය සම්බන්ධීකරණය

පූජ්‍ය දඹෝරේ පියරතන හිමි

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ආගම)

## සැකසුම

එච්.ඒ.එන්.වයි. චන්ද්‍රසේකර මිය.

බප/කැල/ දුටුගැමුණු මහා විද්‍යාලය, පැළියගොඩ.

ජී.යූ.පී. පියසේකර මිය.

බප/කැල/ සිරිසිදුහත් කණිෂ්ට විද්‍යාලය.

**සියලුම හිමිකම් ඇවිරිණි.**

**2021 - දෙවන වාරය**

**9 ශ්‍රේණිය**

**7 වන පාඩම - ධම්ම පදයෙන් බිඳක්**




- ❖ **සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායේ ග්‍රන්ථ 15 අතරින් එකක් ලෙස ධම්ම පදය නම් කළ හැකිය.**
- ❖ **මෙය ගුරු කොටගෙන කුරුණෑගල යුගයේ දී ධම්ම පදට්ඨ කථාව ලියැවිණි**
- ❖ **ධම්ම පදය වග්ග 26 කින් හා ගාථා 423 කින් සමන්විතය.**
- ❖ **බුදු දහමේ එන බොහෝ ධර්ම කාරණා සරල ලෙසත් සුගම ලෙසත් මතුකර දෙන්නට ධම්ම පදය සමත් වී ඇත.**
- ❖ **මෙහි එන ගාථා පාඨයන් තුළින් ලබාදෙන ජීවන උපදේශයන් අතිශයින් පුලුල්ය.**
- ❖ **ධම්ම පද ග්‍රන්ථයෙහි ඇතුළත් සෑම ගාථාවකින්ම වටිනා ජීවිත උපදේශ සපයන අතරම එම දේශනාව සඳහා හේතු වූ පසුබිම ඇසුරින් ගොඩ නැගුණ විවිධ උපමා අලංකාර සහිත කතා පුවතක් ද අන්තර්ගත වීම ඉතා සුවිශේෂී කරුණකි.**

❖ **අංක 1 සිට 5 තෙක් ප්‍රශ්න වලට වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ධම්ම පදය නම් ධර්ම ග්‍රන්ථය සම්බන්ධයෙන් නොගැළපෙන වගන්තිය තෝරන්න.
   I. බෞද්ධ දර්ශනයේ එන ගැඹුරුම ධර්ම කරුණු සරලව උපමා භාවිතයෙන් විස්තර කර ඇත.
   II. ගාථා 450 කින්ද, පරිච්ඡේද 28 කින්ද දක්නට ලැබේ.
   III. සූත්‍ර පිටකයේ පස්වන කොටස වන ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයකි.
   IV. අගනා දහම් කරුණු පාලි පද අනුසාරයෙන් ඉදිරිපත් කර ඇත.

02. සුකරානි අසාධූනි යන ගාථාව බුදුරදුන් දේශනා කළේ කවුරුන් අරබයා ද?
   I. ආනන්ද හිමියන්
   II. අජාසත් රජතුමා
   III. චුල්ලකාල උපාසක තුමා
   IV. දෙව්දත් තෙරුණ්

03. ධම්ම පදය ග්‍රන්ථයෙහි අන්තර්ගත ගාථා ගණන කොපමණ ද?
   I. 453
   II. 423
   III. 432
   IV. 433

04. ලෝවැඩ සගරාව නම් පද්‍ය ග්‍රන්ථයේ කතුවරයා වන්නේ ,
   I. වීදාගම හිමියන්
   II. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්
   III. බුද්ධ ඝෝෂ හිමියන්
   IV. බුද්ධ රක්ඛිත හිමියන්

05. සාධු චර්යා යන්නෙන් අදහස් කරන්නේ,
   I. අයහපත් චර්යාවන් ය
   II. යහපත් චර්යාවන් ය
   III. නොමනා හැසිරීම් ය
   IV. ඉන්ද්‍රියයන් සංවර කර ගැනීම ය.

❖ **පහත සඳහන් ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

1. සාධු චර්යා යනු ........................................................................................................................ ය.
2. දෙව්දත් තෙරුණුවන් අපායගාමී වූහ. අපායගාමී යනු පිරිහීම ............................................................ යන අර්ථ දෙන පදයකි.
3. දෙව්දත් තෙරුණුවන් ශ්‍රද්ධාවන්ත අජාසත් මහරජතුමා ද.......................................................... පාප කර්මයටයොමු කළේය.
4. අපගේ සාධු සම්මත ජීවිත නැමැති කිරි කළයට ................................................................ ගොම බිඳුව එකතු වීමට ඉඩ නොතැබිය යුතුයි.
5. නොකළ වරදට තාඩන පීඩන ලද ................................................................. උපාසක තුමා අධ්‍යාත්මික වශයෙන් ජීවිතයේ උසස්ම තත්වයට පත්කර ගත්තේය.

**(චුල්ලකාල , සැපනැති තැන, ආනන්තරීය, අයහපත් චර්යා, යහපත් චර්යා)**

❖ **පෙළපොත හොඳින් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

1. ධම්මපදය අයත් නිකාය හා පිටකය නම් කරන්න.
2. බෞද්ධයාගේ අත්පොත ලෙසින් හැඳින්වෙන්නේ කුමක් ද?
3. ධම්ම පදය ග්‍රන්ථයට අයත් වග්ග ගණන කොපමණ ද?
4. ඛුද්ධක නිකායට අයත් ග්‍රන්ථ ගණන කොපමණ ද?
5. **"සුකරානී අසාධුනි"** ගාථාව අයත් වග්ගය කුමක් ද?
6. **"අත්තනාව කතං පපං....."** යන ගාථා පාඨය දේශනා කොට වදාළේ කවුරුන් අරබයා ද?
7. පුද්ගලයෙකු විසින් සිදුකරනු ලබන ක්‍රියා කොටස් දෙකකට බෙදේ. ඒවා නම් කරන්න.
8. **"කරන කලට පව් මිහිරිය මී සේ......"** යන පද්‍ය ඇතුළත් ග්‍රන්ථය නම් කරන්න.
9. දෙව්දත් තෙරුන් තම අයහපත් ක්‍රියා සඳහා සම්බන්ධ කරගත් රජ කවුරුන් ද?
10. දෙව්දත් තෙරුන් සිදුකරගත් ආනන්තරීය පාප කර්මය කුමක් ද?

**2021 - දෙවන වාරය**
**9 ශ්‍රේණිය**
**8 වන පාඩම - උතුම් පැවැත්මෙන් දිවි මං සරු කරමු**




- **යහපත් සිතුවිලි වලින් සිත පෝෂණය කරගැනීම දෙලොව යහපතට හේතු වේ.**
- **බ්‍රහ්ම විහාර / බඹ විහරණ යනුවෙන් සඳහන් මෙත්තා,කරුණා,මුදිතා,උපේක්ඛා යන කාරණාවන් ය.**
- **උතුම් හැසිරීම උතුම් පැවැත්ම යන අදහස් ගෙනදෙන බ්‍රහ්ම විහරණයන් චතු අප්පමඤ්ඤා වශයෙන් හඳුන්වයි.**
- **දෙමාපියන් තුළ දරුවන් කෙරෙහි මෙම කාරණා හතර පවතින නිසා ඔවුන් මහා බ්‍රහ්මයාට උපමා කර තිබේ.**

- **අංක 1 සිට 5 තෙක් ඇති ප්‍රශ්න වලට වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) චතුඅප්පමඤ්ඤා යනුවෙන් බුදු දහමෙහි හැඳින්වෙන්නේ,
   i. සතර සංග්‍රහ වස්තු ය.
   ii. චතුරාර්ය සත්‍ය ධර්මයන් ය.
   iii. සිව් බඹ විහරණය
   iv. සතර මහා භූත රූප වේ.

02) අන් අයගේ දියුණුව දැක එම දියුණුව තමාට ඇති වූවක් සේ සළකා සතුටට පත්වන ස්වභාවය,
   i. කරුණාවයි
   ii. මුදිතාව යි
   iii. මෛත්‍රීයයි
   iv. උපේක්ෂාවයි

03) කෙනෙකු දුකට කරදයට පත් වූ විට උදව් කිරීම සඳහා පොළඹවන සිතුවිල්ල, වර්තමානයේ හඳුන්වනුයේ,
   i. පරාර්ථකාමීත්වයයි.
   ii. සහකම්පනයයි
   iii. හිතවත් කමයි
   iv. ඊර්ෂ්‍යාවයි.

04) කිසිදු ලාභ අපේක්ෂාවකින් තොරව පුද්ගලයෙකු කෙරෙහි ඇතිවන්නා වූ සැබෑ හිතවත්කම හඳුන්වනුයේ,
   i. උපේක්ෂා සහගත බවයි
   ii. කාරුණික බවයි
   iii. යටහත් බවයි
   iv. මෛත්‍රී සහගත බවයි.

05) පහත පිළිතුරු වලින් සිවුබඹ විහරණ වලට අයත් නොවන පිළිතුර වන්නේ,
   i. මෛත්‍රීය
   ii. කරුණාව
   iii. මැදිහත් බව
   iv. ඊර්ෂ්‍යාව

❖ **පහත සදහන් ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.**

1. **මවක තම එකම පුතුට දක්වන හිතවත්කමට සමාන හිතවත් කමක්** සියලු ජීවීන් කෙරෙහි දැක්විය යුතු බව ..................................................... .... සූත්‍රයේ සදහන් වේ.
2. නැදෑ හිතවත්කම් කිසිවක් නොමැති පුද්ගලයෙකුගේ දියුණුවක දී ආයාසයකින් තොරව සතුටට පත්වීමට හැකිවීම ........................................................................ ලෙස හැදින්වේ.
3. කරුණාව මැනවින් ප්‍රගුණ කිරීම ...................................................................... වශයෙන් හැදින්වේ.
4. උපේක්ෂා ගුණය දියුණු කරගත් විට **ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා, සැප, දුක්** ආදී........................................................................ හමුවේ නොසැලී වාසය කිරීමට හැකිය.
5. ලෝකයේ හා ජීවිතයේ ස්වභාවය පිළිබඳ මනා වැටහීමක් සහිතව කවර තත්වයක් හමුවේ වුවද **සිතෙහි සමබරතාවය** පවත්වා ගැනීමට ඇති හැකියාව ......................................................... ලෙස හැදින්වේ.

❖ **පෙළපොත හොදින් කියවා පිළිතුරු ලියන්න.**

1. සිව් බඹ විහරණ හදුන්වන වෙනත් නම් ලියන්න.
...........................................................................................................................................
...........................................................................................................................................
2. සිව්බඹ විහරණ නම් කරන්න.
...........................................................................................................................................
...........................................................................................................................................
...........................................................................................................................................
...........................................................................................................................................
3. බ්‍රහ්ම විහරණ යන වචනයේ තේරුම කුමක් ද?
...........................................................................................................................................
...........................................................................................................................................
4. මෛත්‍රී භාවනාව යනු කුමක් ද?
...........................................................................................................................................
...........................................................................................................................................
5. සිව්බඹ විහරණ ප්‍රගුණ කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන පෙන්වා දෙන්න.
...........................................................................................................................................
...........................................................................................................................................

# 2021 - දෙවන වාරය
# 9 ශ්‍රේණිය
# 9 වන පාඩම - සීල සුගන්ධයම උතුම් වන්නේය



- ❖ සීලය යනු කායික වාචසික ශික්ෂණයයි.(කාය වාචාය සමෝධානං සීලං)
- ❖ දුෂ්චරිතයෙන් මිදී පුද්ගලයා සුචරිතයෙහි නිරත වූ විට ඔහු තුළ හික්මීමක් ඇතිවෙයි.
- ❖ නිවන් මගේ පදනම හෙවත් අත්තිවාරම සීලයයි.
- ❖ ඊට හේතුව සීලය මත පිහිටා සෙසු ප්‍රතිපදාවන් අනුගමනය කරන හෙයිනි.

❖ **ඉහත පාඩම කියවා 1 සිට 5 තෙක් ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සීලයේ ප්‍රධාන කොටස්
   i. දෙකකි
   ii. තුනකි
   iii. හතරකි
   iv. පහකි

02. පුද්ගලයාට පව් කිරීමට ඇති ලැජ්ජාව හා බය හඳුන්වනුයේ,
   i. විරමණය යි
   ii. අත්තූපනායක ධර්මය යි
   iii. හිරිඔත්තප්පයයි
   iv. සීලය යි

03. අංග තුනකින් හෙවත් තුන් ආකාරයකින් සීලය ආරක්ෂා කිරීම හඳුන්වනුයේ,
   i. අටසීලය යි
   ii. දස සීලයයි
   iii. ත්‍රිශික්ෂාව යි
   iv. ත්‍රිකෝටික පාරිශුද්ධ සීලය යි

04. පහත ක්‍රියා අතුරින් චාරිත්‍ර සීලයට අයත් නොවන්නේ,
   i. බොරු කීමෙන් වැලකී ක්‍රියා කිරීම යි.
   ii. නොදුන්දේ ගැනීම හෙවත් හොරකමෙන් වැලකීම යි.
   iii. පරපණ නැසීමෙන් වැලකී ක්‍රියා කිරීමයි.
   iv. ශිෂ්ඨ සම්පන්න අඹු සැමි ජීවිතයක් ගත කිරීමයි.

05. පන්සිල්, අටසිල්, දසසිල් වලින් එක් එක් ප්‍රමාණයට සිදු කරනුයේ අපගේ කායික හා වාචසික සදාචාරය ඇති කිරීමයි. මෙම ක්‍රියාවලිය හැඳින්වෙනුයේ,
   i. භාවනාව නමිනි
   ii. සමාධිය නමිනි
   iii. සීලය නමිනි
   iv. විමුක්තිය නමිනි

❖ **පහත සදහන් වගන්ති හරිනම් (√) ලකුණ ද, වැරදිනම් (×) ලකුණ ද යොදන්න.**

1) සීලයෙහි ප්‍රධාන කොටස් පහකි. (.....................)

2) චාරිත්‍රයෙන් පමණක් සීලය අංග සම්පූර් ණ නොවේ. (.....................)

3) කාමය වරදවා හැසිරීමෙන් වැළකීම චාරිත්‍ර සීලයයි. (.....................)

4) හිරි ඔත්තප්ප දෙක දේව ධර්ම හෙවත් ලෝකපාලක ධර්ම ලෙස හැදින්වේ. (.....................)

5) සීලය පුද්ගලයාගේ දියුණුව සලසයි. (.....................)

❖ **පෙළපොත හොඳින් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

1. සීලය යන්න අර්ථ දක්වන්න.
2. සීලයට අයත් මාර්ග ලියන්න.
3. පුද්ගලයෙකු විසින් රැස්කරගත යුතු ආධ්‍යාත්මික ධන ගණන කොපමණ ද?
4. චාරිත්‍ර යනු කුමක් ද?
5. චාරිත්‍ර සදහා යෙදෙන තවත් නමක් ලියන්න.
6. ත්‍රිශික්ෂාව ලියා දක්වන්න.
7. සසර නිවමා දුක දිනා විමුක්තිය උදාකර ගැනීම සඳහා බුදුරජාණන් වහන්සේ වදාළ මාර්ගය කුමක් ද?
8. ත්‍රිකෝටික පාරිශුද්ධිය යනු කුමක් ද?
9. සීලය ආරක්ෂා කිරීමේ ආකාර තුන ලියන්න.
10. අත්තූපනායික ධර්ම පර්යාය යනු කුමක් ද?
11. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, යන වචන වල තේරුම කුමක් ද?
12. හිරි ඔත්තප්ප හේතු කොටගෙන අප සිල්වත් වන අයුරු පෙන්වා දෙන්න.
13. සම්මා කම්මන්තයට අයත් අංග ලියන්න.
14. සම්මා වාචායට අයත් අංග ලියන්න.
15. පාසල් ශිෂ්‍යයෙකු ලෙස සිල්වත් වීමෙන් සිදුවන යහපත පැහැදිලි කරන්න.

**2021 - දෙවන වාරය**

**9 ශ්‍රේණිය**

**10 වන පාඩම - ඉටු කරමු යුතුකම්.**




- ❖ **ගිහි විනය ලෙස සිගාලෝවාද සූත්‍රය හැඳින්විය හැක.**
- ❖ **මෙහි අන්තර් ගත සදිසා නමස්කාරය තුළ සමාජ සංස්ථා හයක් පිළිබඳ ඉගැන්වේ.**
- ❖ **මව්පිය-දූදරු , ගුරු-ශිෂ්‍ය , අඹු-සැමි, මිතුරන්-මිතුරන් අතරේ ඉටුවිය යුතු යුතුකම් පිළිබඳව ද මෙම සූත්‍රයෙහි සාකච්ඡා කෙරේ.**
- ❖ **සමාජ සංස්ථා අතර යුතුකම් ඉටුවීම හරහා අන්‍යෝන්‍ය වශයෙන් බැඳීමක් හා ගෞරවයක් ගොඩනැගේ.**

- ❖ **ඉහත පාඩම කියවා 1 සිට 5 තෙක් ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. යුතුකම් ඉටුකරන අන්‍යෝන්‍ය සුහදතාවය පිරි සමාජයකට මග පෙන්වන සිගාලෝවාද සූත්‍රයේ යට දිශාවෙන් සංකේතවත් වනුයේ,

i. ගිහි-පැවිදි සබඳතාව ii. සේව්‍ය-සේවක සබඳතාවය

iii. ගුරු-සිසු සබඳතාව iv. මව්පිය-දූදරු සබඳතාවය

02. සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන ආකාරයට පැවිදි උතුමන් ගිහියා කෙරෙහි ධර්ම දානයෙන් ප්‍රති උපකාර කළ යුතු ආකාර,

i. පහකි. ii. හතරකි.

iii. හතකි iv. හයකි

03. බුදුන් වහන්සේ දේශනා කළ පරිදි සේවකයා විසින් තම ස්වාමියාට ඉටුකළ යුතු යුතුකමක් ලෙස සඳහන් නොවන්නේ,

i. ස්වාමියාගේ වැරදි පෙන්වා දීම.

ii. ස්වාමියා දුන් දෙය පමණක් ගැනීම.

iii. ස්වාමියාට පසුව නිදා ගැනීම.

iv. ස්වාමියාගේ ගුණ වර්ණනා කිරීම.

04. ජාත්‍යන්තර ප්‍රඥප්තියට අනුව සේවා මුරයකට සේවකයෙකුට අයිති පැය ගණන වන්නේ,

i. 12 ii. 8 iii. 6 iv. 24

05. සිගාලෝවාද සූත්‍රයට අනුව පැවිදි උතුමන්ගෙන් ගිහියාට සිදුවන යුතුකමක් නොවන්නේ,

i. යහපත් ක්‍රියාවල යෙදවීම.

ii. නොඇසූ දහම් කරුණු ඇසීමට සැළැස්වීම.

iii. මෛත්‍රියෙන් සිතීම.

iv. යහපත් ක්‍රියාවල යෙදවීම.

❖ **පහත සඳහන් වගන්ති හරිනම් (√) ලකුණ ද, වැරදිනම් (×) ලකුණ ද යොදන්න.**

1. සිගාලෝවාද සූත්‍රයේ දී සේව්‍ය සේවක සබඳතාව සඳහන් කිරීමේ දී එය යට දිසාව ලෙස නම් කර ඇත. (...............)
2. සේව්‍යයා තම සේවකයාට යුතුකම් අටකින් සංග්‍රහ කළ යුතුය. (...............)
3. වැරදි ක්‍රියාවලින් වළක්වා ගැනීම පැවිදි උතුමන් සතු යුතුකමකි. (...............)
4. සේව්‍ය-සේවක යුතුකම් නිසිලෙස ඉටුවීමෙන් දෙපාර්ශවය අතර ගැටම් අවම වී කාර්යක්ෂම සබඳතාවන් ගොඩනැගේ. (...............)
5. ගිහියා දුර්දශා සම්පන්න කාලවකවානු වලදී ජීවිත පරිත්‍යාගයෙන් භික්ෂූන් ආරක්ෂා කොට ඇත. (...............)


❖ **පහත සඳහන් හිස්තැන් පුරවන්න.**

1. සේව්‍ය-සේවක සබඳතාවය රිය සකෙහි , ........................................................., ......................................................... සහ අර අතර සම්බන්ධය මෙනි.
2. ආහාර පාන වැටුප් ආදිය යහපත් ලෙස ලබාදීම ..................................................................... සතු යුතුකමකි.
3. ස්වාමියාගෙන් සංග්‍රහ ලබන සේවකයා ..................................................................... සහ ................................................................. තම වගකීම් ඉටුකළ යුතුය.
4. භික්ෂූන් වහන්සේගේ සිතෙන සෑම සිතුවිල්ලක්ම ..................................................................... විය යුතුය
5. භික්ෂූන් වහන්සේලාට ..................................................................... උවටැන් කිරීම ගිහියාගේ යුතුකමකි.

❖ **පෙළ පොත කියවා ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

1. යුතුකම් හා වගකීම් පිළිබඳ ඉගැන්වෙන සූත්‍ර දේශනාව නම් කරන්න.
2. පුද්ගලයාගේ අභිවෘද්ධිය කොටස් දෙකකින් යුක්තය ඒවා නම් කරන්න.
3. සිව් වනක් පිරිස නම් කරන්න.
4. බුදු දහමින් සුපෝෂිත ශ්‍රේෂ්ඨ කලා නිර්මාණ තුනක් නම් කරන්න.
5. ස්වාමියා විසින් සේවකයාට ඉටුකළ යුතු යුතුකම් නම් කරන්න.
6. සේවකයා විසින් ස්වාමියාට ඉටුකළ යුතු යුතුකම් නම් කරන්න.
7. ගිහියා විසින් පැවිදි උතුමන්ට ඉටුකළ යුතු යුතුකම් මොනවාද?
8. පැවිදි උතුමන් විසින් ගිහියාට ඉටුකළ යුතු යුතුකම් නම් කරන්න.
9. ගිහිපැවිදි යුතුකම් සමාජ දියුණුවට හේතුවන අයුරු පහදන්න.
10. පාසලේ දියුණුවට ඔබට කළහැකි යුතුකම් තුනක් ලියන්න.

## 2021 - දෙවන වාරය
## 9 ශ්‍රේණිය
## 11 වන පාඩම - බුදුබව පැතූ බලංගොඩ මහානායක හාමුදුරුවෝ



- **උපත 1896 අගෝස්තු 3 වන දින බලංගොඩ කිරිදගලදීය.**
- **ගිහි නම - විලියම්**
- **මවගේ නම - හීන් මැණිකේ**
- **පියාගේ නම- නාරංගොඩ ආරාච්චිගේ මෙතියස් හාමි නොහොත් මද්දුහාමි උස්වත්ත ගේ**
- **පැවිද්ද - 1911 මාර් තු 02**
- **පැවිදි වූ දා පටන් උන්වහන්සේගෙන් ශාසන , ශාස්ත්‍රීය සමාජීය සේවාවන් රාශියක් සිදුවිය.**

- **1 සිට 5 තෙක් ප්‍රශ්න වලට වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.**

01. බලංගොඩ ආනන්ද මෛත්‍රී නාහිමියන්ගේ ගිහිකළ නාමය වන්නේ,
    i. ජේම්ස් ii. එඩ්වඩ් iii. විලියම් iv. ජෝර්ජ්

02. බලංගොඩ නා හිමියන්ට කුඩා අවධියේ සිටම ජාතිකත්වය පිළිබඳ හැඟීම් ඇතිවීම සඳහා බලපාන ලද්දේ කාගේ දේශනද ?
    i. අනගාරික ධර් මපාල තුමාගේ
    ii. ඕල්කට් තුමාගේ
    iii. වලිසිංහ හරිස්චන්ද්‍ර තුමාගේ
    iv. දොන් බාරොන් ජයතිලක මහතාගේ

03. අන්‍යාගමිකයන්ගේ බෞද්ධ විරෝධී විවේචන සඳහා ආනන්ද මෛත්‍රී හිමියන් විසින් ආරම්භ කරන ලද පුවත්පත වන්නේ ,
    i. සරසවි සඳරැස ii. ලක්මිණි පහණ
    iii. ශ්‍රී බුද්ධ රශ්මි iv. රිවි කිරණ

04. බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමියන්ගේ කලින් තිබූ පැවිදි නම කුමක් ද?
    i. බලංගොඩ ධම්ම ගවේසි
    ii. බලංගොඩ සරණ ගවේසි
    iii. බලංගොඩ සීල ගවේසී
    iv. බලංගොඩ කුසල ගවේසී

05. බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමියන් විසින් 1928 දී දහම් පාසල් දරුවන් සඳහා රචනා කරන ලද ග්‍රන්ථය වන්නේ,
    i. කවි දැහැන
    ii. බුද්ධ චරිතය
    iii. බාලාවතරණය
    iv. බෝධි වංශය

❖ පහත සඳහන් ප්‍රශ්න වල හිස්තැන් පුරවන්න.

1. නාලන්දා විද්‍යාලයේ ...................................................................... යන ආදර්ශ පාඨය ආනන්ද මෛත්‍රී හිමියන්ගේ නිර්මාණයකි.
2. බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමියන් 1954 බුරුමයේ පැවති ජට්ඨ සංගායනාවේ ................................................ ලෙස තෝරා ගැනීමත් අට්ඨ කතා සංගායනාවේ ............................................................... ලෙසත් තේරී පත්වීම අපලද ගෞරවයකි.
3. බලංගොඩ සරණ ගවේසී හිමියන් ........................................................... සීමා මාලකයේ දී ................................................................. උපසම්පදාව ලැබූහ.
4. බලංගොඩ නාහිමි ගිහි ජීවිතයේ කුඩා කළ ජාතක කතා කියා දෙමින් දැනුමින් පෝෂණය කළේ ................................................................. විසිනි.
5. බලංගොඩ නාහිමි අවුරුදු ............................................................. ක් ආයු වළඳා සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය බව පසක් කරමින් අපවත් වූහ.

❖ පහත සඳහන් වගන්ති හරිනම් (√) ලකුණ ද වැරදිනම් (×) ලකුණ ද යොදන්න.

1. බලංගොඩ සරණ ගවේසී හිමියන් උපසම්පදාවෙන් වසර දෙකකට පසු බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමියන් ලෙස නම වෙනස් කර ඇත. (............)
2. උන්වහන්සේ නාලන්දා විද්‍යාලයේ ආචර්යවරයෙකු ලෙස වසර 8 ක් සේවය කළහ. (............)
3. බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමියන් 1926 දී ඉන්දියාවේ කැලිකට් නගරයට වැඩම කළහ. (............)
4. ධර්මපාල තුමා සමග විදේශ ධර්ම ප්‍රචාරයට බාන්ස් රත්වත්තේ රටේ මහත්තයා සහයෝගය දී ඇත. (............)
5. 1956 විද්‍යෝදය විද්‍යාලයේ බෞද්ධ අධ්‍යාපන අංශයේ මහාචාර්ය ධූරයක් උන්වහන්සේට හිමි විය. (............)

❖ පෙළ පොත කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු පහක් නම් කරන්න.


1. බලංගොඩ නාහිමියන් ලැබූ ගෞරව නාම පහක් නම් කරන්න.
2. බලංගොඩ හිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ නම් කරන්න.
3. බලංගොඩ නා හිමියන් දැන් සිටි භාෂාවන් මොනවා ද?
4. බලංගොඩ නා හිමියන් සිදුකළ සේවාවන් ලියන්න.
5. බලංගොඩ නා හිමියන්ගේ චරිතයේ සුවිශේෂී ගුණාංග විස්තර කරන්න.

**2021 - දෙවන වාරය**

**9 ශ්‍රේණිය**

**12 වන පාඩම - අටලෝ දහමින් කම්පා නොවෙමු.**




*ඵුට්ඨස්ස ලෝකධම්මෙහි*

*චිත්තං යස්ස න කම්පති*

*අසෝකං විරජං ඛේමං*

*ඒතං මංගල මුත්තමං*




- ❖ **අටලෝ දහමින් නොසැලී කටයුතු කිරීම මංගල කරුණක් බව මහා මංගල සූත්‍රයෙහි සඳහන් වෙයි.**

- ❖ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. අටලෝ දහමින් කම්පා නොවී කටයුතු කිරීම දියුණුවට කරුණක් ලෙස සඳහන් වන්නේ,
   i. රතන සූත්‍ර දේශනාවේ ය. ii. මහා මංගල සූත්‍ර දේශනාවේ ය.
   iii.කරණීය මෙත්ත සූත්‍ර දේශනාවේ ය. iv. සිඟාලෝවාද සූත්‍ර දේශනාවේ ය.
2. මංගල කරුණක් යනු,
   i. පුද්ගලයාට සතුටු දායක කරුණකි. ii. පුද්ගලයාගේ පිරිහීම ඇති කරන කරුණකි.
   iii.පුද්ගලයාගේ දියුණුව ඇති කරන කරුණකි. iv. පුද්ගලයාට දුක ඇති කරන කරුණකි.
3. අටලෝ දහමින් කම්පා නොවී කටයුතු කිරීම මංගල කරුණක් ලෙස සඳහන් වන ගාථා පාඨයේ මුල් පදය වන්නේ,
   i. සේලෝ යථා ඝණෝ .......... යන්න යි. ii. ඵුට්ඨස්ස ලෝක ධම්මෙහි ............. ය න්න යි.
   iii.අප්පමාදෝ අමතපදං........ යන්න යි. iv. නහි වේරේන වේරානි ......... යන්න යි.
4. නොගැලපෙන වරණය තෝරන්න.
   i. ලාභ - අලාභ ii. නින්දා - ප්‍රසංසා iii. යස - දුක් iv. සැප - දුක්
5. බුදුන්වහන්සේට දානය පවා නොමැතිව වස් සමාදන්ව වැඩසිටින්නට සිදු වූයේ උන්වහන්සේ,
   i. වේරංජා නුවර වැඩ සිටි කාලයේ දී ය. ii. සැවැත් නුවර වැඩ සිටි කාලයේ දී ය.
   iii.රජගහ නුවර වැඩ සිටි කාලයේ දී ය. iv. බරණැස් නුවර වැඩ සිටි කාලයේ දී ය.

❖ **හිස්තැන් සඳහා සුදුසු පිළිතුරු සපයන්න.**

1. පසේ නදී කොසොල් රජු මියගියේ..........................................................................................දීය.
2. බිම්බිසාර රජුට අවසන් කාලයේ.......................................................................සිට මිය යෑමට සිදු විය.
3. සැපයේ ආකාර දෙක වන්නේ.....................................................සහ ...................................................යයි.
4. දුකෙහි ආකාර දෙක වන්නේ.....................................................සහ ...............................................යයි.
5. බුදුරදුන්ට වැළඳුණු දරුණු රෝග වන්නේ................................................................................ රෝගයයි.
6. අටලෝ දහම සියලුදෙනාටම මුහුණදීමට සිදුවන පොදු.......................................................................... යකි.

..........................................................................................................................................................

..........................................................................................................................................................

..................................................................................................................................

7. එම ගාථාවේ අර්ථය ලියන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

..................................................................................................................................

8. **'ලාභෝ අලාභෝ අයසෝ යසෝ ච'** මෙම ගාථාව සම්පූර්ණ කරන්න.

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

9. එම ගාථාවේ අර්ථය ලියන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

..................................................................................................................................

10. **'සේලෝ යථා ඒකඝනෝ'** යන ගාථාව සම්පූර්ණ කරන්න.

..........................................................................................................................................................

...................................................................................................................................

❖ **පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

1. බුදුරජාණන් වහන්සේට සිවුපසයෙන් උපස්ථාන කළ රාජකීය පුද්ගලයන් හතර දෙනෙකු නම් කරන්න.
2. බුදුන්වහන්සේට අස්ථානයේ අපහාස කළ ස්ත්‍රීන් තිදෙනෙකු නම් කරන්න.
3. නින්දා හා ප්‍රසංසා පද දෙකෙහි අර්ථය වෙන වෙනම ලියන්න.
4. බුදුරජාණන් වහන්සේට කායික වේදනා ඇතිවූ අවස්ථා හතරක් නම් කරන්න.
5. ඔබේ ජීවිතයේ අලාභ, දුක් ඇතිවන අවස්ථාවන් වලදී ඔබ කටයුතු කළ යුත්තේ කෙසේ ද?
6. අටලෝදහමින් කම්පා නොවන ශිෂ්‍යයකුගේ ගුණාංග තුනක් ලියන්න.

**ලාභ - අලාභ, යස - අයස, නින්දා - පසංසා, සුඛ - දුක්ඛ යනු අටලෝ දහමයි. අංග අටකින් යුත් නිසා අෂ්ට යනුවෙන් පැවසේ. ලෝකයාට බලපාන නිසා ලෝක යැයි කියනු ලැබේ. ධර්ම යනු ස්වභාවයයි. මෙය සැමදෙනාට එකසේ බලපායි. පාසල් දරුවන් වන අපට ද මේ ධර්මතාවලට මුහුණ දීමට සිදුවේ. ඒවාට අකම්පිත ව, ඉවසීමෙන් හා අවබෝධයෙන් යුතු ව මුහුණ දීමට අප පුරුදු විය යුතු ය.**

**2021 - දෙවන වාරය**
**9 ශ්‍රේණිය**
**13 වන පාඩම - වැවයි දාගැබයි ගමයි පන්සලයි.**



- **ලක්දිව ආගමික, සංස්කෘතික, සමාජික හා ජාතික නවෝදයේ ප්‍රබලතම සාධකය මහින්දාගමනයයි.**
- **මහින්දාගමනයත් නිසා සංවර්ධනය වූ වැවයි-දාගැබයි, ගමයි- පන්සලයි යන සංස්කෘතික සංකල්පය රටේ සදාචාරාත්මක සංවර්ධනයේ කැඩපතයි.**
- **ලාංකේය ජනසාමාජයේ සාමය හා සහජීවනය ඇති වූයේ වැවයි- දාගැබයි, ගමයි- පන්සලයි යන උදාර සංකල්පය හේතුවෙනි.**

- **හිස්තැනට සුදුසු වචන යොදා පිළිතුරු සපයන්න.**

1. මෙරට ජාතික, ආගමික සංස්කෘතික හා සමාජික නවෝදයක් ඇති වූ යේ........................................................ ................................................................ ප්‍රතිඵලයක් ලෙස ය.
2. අපගේ අනන්‍යතාව කුමක් දැයි ලොවට හෙළිකිරීමෙහි ලා පෙරමුණ ගෙන ඇති අංග දෙක වන්නේ .................................................................................යි.
3. ................................................................................................ යන්න තුන් සිංහලය ලෙස හැඳින්වේ.
4. මෙරටට වාරි පද්ධතියක අවශ්‍යතාව දැනුනේ මෙරට................................................................. රටක් නිසා ය.
5. සාගර වැනි විශාල වැව් තැනීමෙන් අපේ මුතුන් මිත්තන් අපේක්ෂා කළේ ප්‍රජා සංවර්ධනයෙහි පදනම වන ...................................................................................සංවර්ධනය යි.
6. යැපීමට තරම් සම්පත් ඇතිකම................................................................................ ලෙස බුදු දහම උගන්වයි.
7. පරාර්ථ චර්යාව පිළිබඳ බුදු දහමේ එන ඉගැන්වීම් හකුළා දක්වන සංකේතය වන්නේ ......................................... .................................................. යි.
8. දාගැබ මගින් සංකේතවත් වන්නේ පිළිපැදිය යුතු.................................................................... ත් පසක් කළ යුතු ............................................................. ත්ය.
9. ගමේ මුදුන්මල්කඩ වන්නේ ......................................................................................... යයි.
10. බෞද්ධයෙකුගේ පරම යුතුකම වන්නේ.................................................................................. නොවී ජීවත් වීමයි.

❖ **පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

2. බුදු දහමේ සඳහන් පරිදි අධාර්මික රැකියාවන් නම් කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

3. පන්සලෙන් ගම් වැසියන්ට සිදුවන සේවාවන් මොනවාද?

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

4. පාඩමේ සඳහන් බුදුරදුන්ගේ ශාරීරික ධාතු තැන්පත් කොට තනවා ඇති දාගැබ් දෙකෙහි නම් ලියන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

5. එදා පැවති ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාවේ පදනම කුමක්දැයි ලියන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................



**2021 - දෙවන වාරය**

**9 ශ්‍රේණිය**

**14 වන පාඩම -**




- බුදු දහම අදහන අප සියලු දෙනාගේ පැතුම සසර කෙළවර නිවන් අවබෝධ කරගැනීමයි.
- පෙළපොතේ දක්වා ඇති ඉදිබුවා හා මළුවා කතාවෙන් දැක්වෙන පරිදි අපි දියෙහි සිටින මාළුවාට සමාන වෙමු. කෙලෙස් සහිත අපට නිවන අවබෝධ කර ගැනීම අපහසු බව හැඟෙයි.
  - *බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනාවෙහි තෙවැනි ආර්ය සත්‍යය වූ දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය මෙසේ දක්වා ඇත.*



දුකට මුල් වන්නා වූ තෘෂ්ණාව මුලුමණින් නැසීමක් වේද, අත් හැරීමක් වේද, දුරලීමක් වේද, එහි නොඇලීමක් වේද එය දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි.

- *නිවන පිළිබඳ තවත් බුද්ධ දේශනයක මෙසේ පැහැදිලි කෙරේ.*

මහණෙනි, හටගත් හෝ නොහටගත් හෝ යම්තාක් (ස්කන්ධ ආදි ) ධර්මයෝ වෙත් ද ඔවුන් අතර විරාගය ම උතුම් යැයි කියනු ලැබේ. එනම් මදය සංසිඳවන, තෘෂ්ණා පිපාසය නැති කරවන, ඇලීම මුලින් උපුටා දමන, පැවැත්ම සිඳ දමන, තෘෂ්ණාව වනසන, විරාගයයි, නිරෝධයයි. නිර්වාණයයි.

❖ **නිවැරදි පිළිතුර තෝරන්න.**

1. බුදුරජාණන් වහන්සේගේ මංගල ධර්ම දේශනාව වන්නේ,
   i. අනන්තලක්ඛණ සූත්‍රය ii. මහාමංගල සූත්‍රය iii. ධම්සක් පැවතුම් සූත්‍රය iv.මහා පරිනිබ්බාන සූත්‍රය
2. දුක්ඛ නිරෝධය යනු
   i. දුකයි ii. සැපයි iii. සතුටයි iv. නිවනයි
3. නිවන අත්දැකීමක් වන්නේ,
   i. මිනිසුන්ට ii. බුද්ධාදී මහරහත් වහන්සේලාට
   iii.සතුන්ට iv. මේ කිසවෙකුට නොවේ
4. තණ්හාවේ ප්‍රධාන කොටස් ගණන,
   i. තුනකි ii. හතරකි iii. පහකි iv. හයකි
5. පස්කම් සැපතෙහි කැමැත්ත ඇති ඉඳුරන් පිනවීමේ රුචිය හැඳින්වෙන්නේ,
   i. කාම තණ්හා නමිනි ii. භව තණ්හා නමිනි iii.විභව තණ්හා නමිනි iv. මේ සියල්ලයි
6. මගේ ය, මම වෙමි, මගේ ආත්මය වේ යැයි සලකා ගන්නා ශාස්වත දෘෂ්ටිය අනුව භවයේ හැකිතාක් සැප විඳීමට ඇති ආශාව හැඳින්වෙන්නේ.
   i. කාම තණ්හා නමිනි ii. භව තණ්හා නමිනි iii. විභව තණ්හා නමිනි iv. මේ සියල්ලයි
7. සියල්ල මරණයෙන් කෙළවර වේ, මතු පැවැත්මක් පුනර්භවයක් නැත යන උච්ඡේද දෘෂ්ටිය මුල් කොට ගත් මෙලොව හැකිතාක් සැප විඳීමට ඇති ආශාව හැඳින්වෙන්නේ,
   i. කාම තණ්හා නමිනි ii. භව තණ්හා නමිනි iii. විභව තණ්හා නමිනි iv. මේ සියල්ලයි
8. තෘෂ්ණාව මුලිනුපුටා දැමීම
   i. භවයයි ii. නිවනයි iii. දුකයි iv. විපතයි
9. සසර ඇතිවන විවිධ දුක් පිළිබඳ දේශනාව වන්නේ
   i. දුක්ඛ ආර්ය සත්‍යයයි ii. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි
   iii.දුකඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයයි iv. දුක්ඛ සමුදය ආර්ය සත්‍යයයි
10. හේතු ප්‍රත්‍ය ඇති කල ඇතිවන නැති කල නැතිවන අනිත්‍ය වූ, දුක් සහිත වූ, අනාත්ම වූ සියල්ල
   i. විඤ්ඤාණ නම් වේ ii. සංඥා නම් වේ iii.සංස්කාර නම් වේ iv. නාමරූප නම් වේ

❖ **හිස්තැන් පුරවන්න.**

1. අප සාංසාරිකව සොයන, විඳින සැප සම්පත්............................................................................. සැපය ලෙස හැඳින්වේ.
2. නිවන යනු ................................................................................................... සැපතකි.
3. නිවන සැපතකැයි කියන්නේ අප සිතන පතන සැප එහි ඇති නිසා නොවේ................................................ ................................ නැති නිසා ය.
4. අසීමිත ආශාවන් ඇති බව, බොහෝ දෑ කැමති වීම.............................................................................. යනුවෙන් හැඳින්වේ.
5. බුදු දහමට අනුව අප හුරු විය යුත්තේ............................................................................................ ජීවිතයක් ගත කිරීමයි.

❖ **පහත අර්ථ සඳහා යෙදිය හැකි තනි පද ලියන්න.**

1. **ලද දෙයින් සතුටුවීම** - .............................................................................................................
2. **පෝෂණය කිරීමට පහසු වීම** - .................................................................................................
3. **අසීමිත අපේක්ෂා නැති අල්පේච්ඡ තැනැත්තා විවේකයෙන් ජීවත් වීම** ..........................................
4. **පැවැත්ම සැහැල්ලුවීම** ..............................................................................................................
5. **ඉන්ද්‍රිය සංවරය** ..........................................................................................................................
6. **නුවණැති බව** ..............................................................................................................................

**2021 - දෙවන වාරය**

**9 ශ්‍රේණිය**


**15 වන පාඩම - දුකින් මිදෙන මග උගනිමු**



❖ **බුදුරජාණන් වහනසේ දුකින් මිදීමේ මාර්ගය ලෙස ආර්ය අෂ්ටාංගික මාර්ගය පෙන්වා දුන් සේක.**

- **චතුරාර්ය සත්‍යය**

1. දුක්ඛ ආර්ය සත්‍යය
2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය




| මාර්ග අංගය | අර්ථය | සම්පූර්ණ විය යුතු කරුණු |
|---|---|---|
| සම්මා දිට්ඨි | නිවැරදි දැකීම | 1. දස වස්තුක සම්මා දිට්ඨිය<br>2. චතුසච්ච සම්මා දිට්ඨිය |
| සම්මා සංකප්ප | නිවැරදි කල්පනාව | 1. නෙක්ඛම්ම සංකප්ප (කාම වස්තුන්ගෙන් වෙන්වීමේ සංකල්පනාව)<br>2. අව්‍යාපාද සංකප්ප (ව්‍යාපාදයෙන් වෙන්වීමේ සංකල්පනාව)<br>3. අවිහිංසා සංකප්ප ( හිංසාවෙන් වෙන්වීමේ සංකල්පනාව) |
| සම්මා වාචා | අයහපත් වචනයෙන් වැළකීම | 1. මුසාවාදා 2. පිසුනාවාචා<br>3. ඵරුදාවාචා 4. සම්ඵප්පලාපා<br>යන මේවා කීමෙන් වැළකීම |
| සම්මා කම්මන්ත | අයහපත් කාය කර්ම වලින් වැළකීම | 1. ප්‍රාණ ඝාතය 2. අදත්තාදානය<br>3. කාමයෙහි වරදවා හැසිරීම<br>යන මෙම ක්‍රියාවන්ගෙන් වැළකීම |
| සම්මා ආජීව | අයහපත් දිවි පැවැත්මෙන් වැළකීම | 1. ආයුධ වෙළදාම 2. සත්ත්ව වෙළදාම<br>3. මස් වෙළදාම<br>4. මත්පැන් වෙළදම<br>5. වස විෂ වෙළදාම ආදියෙන් ජීවත් නොවීම |
| සම්මා වායාම | යහපත් උත්සාහය | 1. උපන් අකුසල් දුරු කිරීමට,<br>2. නුපන් අකුසල් නුපදීමට,<br>3. උපන් කුසල් දියුණු කිරීමට,<br>4. නුපන් කුසල් උපදවා ගැනීමට උත්සාහ කිරීම |
| සම්මා සති | යහපත් සිහිය | සතර සතිපට්ඨාන වැඩීම<br>1. කායානුපස්සනා<br>2. වේදනානුපස්සනා<br>3. චිත්තානුපස්සනා<br>4. ධම්මානුපස්සනා<br>යන අරමුණු තුළ සිහිය මනා කොට පැවැත්වීම. |
| සම්මා සමාධි | නිවැරදි මානසික එකඟ බව | 1. ප්‍රථම ධ්‍යාන 2. ද්විතීය ධ්‍යාන<br>3. තෘතීය ධ්‍යාන 4. චතුර්ථ ධ්‍යාන<br>යන්හි සිත එකඟ බව |

❖ **නිවැරදි පිළිතුර තෝරන්න.**

1. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ පළමු අංගය වන්නේ,

   i. සම්මා සංකප්පය යි      ii. සම්මා සමාධිය යි

   iii. සම්මා දිට්ඨිය යි      iv. සම්මා සතිය යි

2. කාම සංකප්ප, ව්‍යාපාද සංකප්ප හා විහිංසා සංකප්ප යනු

   i. සම්මමා සංකප්ප වේ      ii. මිච්ඡා සංකප්ප වේ

   iii. මිච්ඡා ආජීව වේ      iv. සම්මා ආජීව වේ

3. මුසාවාදා, පිසුණාවාචා, ඵරුෂාවාචා, සම්ඵප්පලාප යනු

   i. වචනයෙන් සිදු කරන වැරදිය      ii. සිතින් සිදු කරන වැරදිය

   iii. කයින් සිදු කරන වැරදිය      iv. මේ සියල්ලෙන්ම සිදු කරන වැරදිය

4. සම්මා කම්මන්ත යනුවෙන් අදහස් කරනුයේ

   i. වචනයෙන් සිදු ක්‍රියා ය      ii. සිතින් සිදු කරන ක්‍රියා ය

   iii. කයින් සිදු කරන ක්‍රියා ය      iv. මේ සියල්ලෙන්ම සිදු කරන ක්‍රියා ය

5. දිවි පැවැත්ම සඳහා අයහපත් වෘත්තීන්හි නිරත වීම

   i. සම්මා ආජීව නම්වේ      ii. මිච්ඡා ආජීව නම් වේ

   iii. මිච්ඡා සංකප්ප වේ      iv. සම්ම සංකප්ප වේ

❖ **හිස්තැන් පුරවන්න.**

1. දුක නැති කිරීමේ මාර්ගයෙහි ඇති අංග ගණන කීයද? ..........................................................................................
2. ශරීරයට අධික සැප දීම හැඳින්වෙන්නේ ........................................................................................ ලෙස යි.
3. ශරීරයට අධික දුක් දීම හැඳින්වෙන්නේ, ........................................................................................ ලෙස යි.
4. ත්‍රිශික්ෂාව යනු .................................., ............................ හා............................................................ යි.
5. දුන් දෙයෙහි විපාක ඇත, කළ හොඳ නරකවල විපාක ඇත, මෙලොවක් පරලොවක් ඇත යනාදී වශයෙන් විස්තර වන්නේ...................................................................යයි.

❖ **පිළිතුරු සපයන්න.**

1. මිච්ඡා සංකප්ප තුන නම්කරන්න.

   ..........................................................................................................................................................

   ..........................................................................................................................................................

2. සම්මා සංකප්පයේ තුන් ආකාරය නම් කරන්න.

   ..........................................................................................................................................................

   ..........................................................................................................................................................

3. වචනයෙන් සිදු කරන වැරදි හතරක් නම් කරන්න.

   ..........................................................................................................................................................

   ..........................................................................................................................................................

4. කයින් සිදු කරන වැරදි තුනක් නම් කරන්න.

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

5. නොකළ යුතු වෙළඳාම් පහ නම් කරන්න.

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

6. දුකින් මිදීම සඳහා වන සිව් වැදෑරුම උත්සාහය ලියන්න.

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

7. **සතර සතිපට්ඨානය** නම් කරන්න.

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

8. සම්මා සමාධි යනු කුමක්ද?

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

❖ **පහත වචන වල අර්ථය ලියන්න.**

I. **සම්මා දිට්ඨි** - ..............................................................................................

II. **සම්මා සංකප්ප** - ..............................................................................................

III. **සම්මා වාචා** - ..............................................................................................

IV. **සම්මා ආජීව** - ..............................................................................................

V. **සම්මා කම්මන්ත** - ..............................................................................................

VI. **සම්මා වායාම** - ..............................................................................................

VII. **සම්මා සති** - ..............................................................................................

VIII. **සම්මා සමාධි** - ..............................................................................................

**2021 - දෙවන වාරය**

**9 ශ්‍රේණිය**

**16 වන පාඩම - නොකර පව්කම් කරමු පින්කම්**

- **"චේතනාහං භික්ඛවේ කම්මං වදාමි, චේතයිත්වා කම්මං කරෝති , කායේන වාචාය මනසා," යනුවෙන් බුදුරජාණන් වහන්සේ කර්මය පිළිබඳව පැහැදිලි කර ඇත.**
- **එහි අර්ථය ලෙස දක්වා ඇත්තේ, 'මහණෙනි මම චේතනාව කර්මය යැයි කියමි, සිතින් සිතා කයින්, වචනයෙන් හා මනසින් කර්ම රැස් කරයි.' යනුවෙනි.**

- කර්මය බුදුදහමේ එන මූලික ඉගැන්වීමකි.
- බුදුරජාණන් වහන්සේ චේතනාව කර්මය බව ප්‍රකාශ කළ සේක.
- කුසල කර්ම හා අකුසල කර්ම යනුවෙන් කර්මය කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.
- අප සිතින්, කයින්, වචනයෙන් සිදුකරන සචේතනික ක්‍රියා කර්ම ගණයට ඇතුලත් වේ.

## කර්මය

### දස කුසල කර්ම

**සිතින් වන කුසල කර්ම**

1. දැඩි ලෝභයෙන් වැළකීම
2. ද්වේශයෙන් වැළකීම
3. වැරදි දෘෂ්ටිවලින් වැළකීම

**කයින් වන කුසල කර්ම**

4.පරපණ නැසීමෙන් වැළකීම
5.සොරකම් කිරීමෙන් වැළකීම
6.කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම

**වචනයෙන් වන කුසල කර්ම**

7.බොරු කීමෙන් වැළකීම
8.කේලාම් කීමෙන් වැළකීම
9.රළු වචන කීමෙන් වැළකීම
10.හිස් වචන කීමෙන්

### දස අකුසල කර්ම

**සිතින් වන අකුසල**

1. දැඩි ලෝභය (අභිජ්ඣා)
2. තරහව (ව්‍යාපාදය)
3. වැරදි විශ්වාසය (මිත්‍යා දෘෂ්ටිය)

**කයින් වන අකුසල කර්ම**

4.පරපණ නැසීම - (ප්‍රාණඝාතය)
5.සොරකම් කිරීම - (අදත්තානය)
6.කාමයෙහි වරදවා හැසිරීම - (කාමමිථ්‍යාචාරය)

**වචනයෙන් වන අකුසල කර්ම**

7.බොරු කීම - (මුසාවාදය)
8.කේලාම් කීම - (පිසුනාවාචය)
9.රළු වචන කීම - (පරුෂ වචන කීම)
10.හිස් වචන කීම - (සම්පප්ලාප)

❖ **නිවැරදි පිළිතුර තෝරන්න.**

1. අජාසත්ත රජු පිතෘ ඝාතනයෙන් බලවත් පසුතැවීමට පත්ව සිටි අවස්ථාවේ බුදුන් වහන්සේ සොයා අඹ උයනට පැමිණියේ,
   i. පූර්ණ කාශ්‍යප ශාස්තෘවරයා සමඟ ය.
   ii. ජීවක වෛද්‍යවරා සමඟ ය.
   iii. අනේපිඬු සිටුතුමා සමඟ ය.
   iv. සෝණදණ්ඩ බමුණා සමඟ ය.
2. බුද්ධ දේශනාව අනුව කර්මය යනු,
   i. චේතනාව යි.
   ii. ක්‍රියාව යි.
   iii. විපාකය යි.
   iv. ශීලය යි.
3. ගවයා පසුපස යන ගැල් රෝදය මෙන් අකුසල ක්‍රියා දුක්ගෙන දෙමින් අප සමඟ එයි. මෙම අදහස ගෙන දෙන ධම්ම පද ගාථාව වන්නේ,
   i. **චේතනාහං භික්ඛවේ කම්මං වදාමි**..... යන්නයි.
   ii. **මනෝ පුබ්බංගමා ධම්මා** ................. යන්නයි.
   iii. **අප්පමාදෝ අමතපදං** ...................... යන්නයි.
   iv. **නහි වේරේන වේරාණි** .................... යන්නයි.
4. අකුසල මූල නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,
   i. අලෝභ, අදෝස, අමෝහ යි.
   ii. ලෝභ, ද්වේශ, මෝහය යි.
   iii. ලෝභ, අලෝභ, අදෝස යි.
   iv. අලෝභ, අමෝහ, අදෝස යි.
5. මානවකයා සත්ත්වයා කර්මය ස්වකීය කොට ඇත. දායාද කොට ඇත. පිළිසරණ කොට ඇත..... බුදුන් වහනසේ මෙසේ වදාළේ,
   i. නිගන්ඨ නාථ පුත්ත තුමාට ය.
   ii. තෝදෙය්‍ය පුත්‍ර සුභ තරුණයාට ය.
   iii. බිම්බිසාර මහරජතුමාට ය.
   iv. අනේපිඬු සිටුතුමාට ය.

❖ **හිස්තැන් පුරවන්න.**

1. පූර්ණ කස්සප ශාස්තෘවරයා ........................................................................................ හෙවත් ක්‍රියාව ........................................................................ කරන්නෙකි.
2. චේතනාහං ............................................. .............................. වදාමි. චේතයිත්වා ............................... ..............................................., වාචාය ................................................................................... .
3. පුද්ගලයා විසින් සිදුකරනු ලබන ක්‍රියා ප්‍රධාන වශයෙන් කොටස් ................................................. කි. එනම් ........................................................ ක්‍රියා හා ........................................................................ වශයෙනි.
4. අප්‍රසන්න ...................................................................................................... ක්‍රියා අකුසල වේ. ප්‍රසන්න ........................................................................ ක්‍රියා ......................................................................... වේ.
5. අකුසල කර්ම සිදු කිරීමට පොළඹවන්නේ............................................................................................. , ....................................................................... සන්තානගත අකුසල මූලයන් ය.

1. පහත ශාස්තෘන් කර්මය පිළිබඳව දැක්වූ අදහස් ලියන්න.

I. **පූර්ණ කස්සප**..............................................................................................

II. **මක්ඛලීගෝසාල**..............................................................................................

..............................................................................................

III. **පකුධ කච්චායන** ..............................................................................................

..............................................................................................

IV. **අජිතකේසකම්බලි** .............................................................................................. .........

..............................................................................................

V. **සංජයබෙල්ලට්ඨිපුත්ත** ..............................................................................................

..............................................................................................

VI. **නිගණ්ඨනාථපුත්ත (ජෛන මහා වීර)** ..............................................................................................

..............................................................................................

2. කර්මය පිළිබඳව බුද්ධ දේශනාව සහ එහි අර්ථය ලියන්න.

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

3. යහපත් පුණ්‍ය කර්ම ගණයට ඇතුලත් වන කුසල කර්ම ලියන්න.

..............................................................................................

..............................................................................................

4. පාපකර්ම ගණයට අයත් වන අකුසල කර්ම ලියන්න.

..............................................................................................

..............................................................................................

5. කුසල මූලයන් තුන නම් කරන්න.

..............................................................................................

6. අකුසල මූලයන් තුන නම් කරන්න.

..............................................................................................

7. බුදුරජාණන් වහන්සේ තෝදෙයපුත්‍ර සුභ මානවකයාට කර්මය පිළිබඳව කළ ප්‍රකාශය උපුටා දක්වන්න.

..............................................................................................

..............................................................................................

..............................................................................................

8. අප්‍රසන්න, අකුසල චේතනාවලින් යුක්ත ව කරන ක්‍රියා අකුසලවේ. යන අදහස ඇතුලත් ධම්ම පද ගාථාව ලියා එහි සම්පූර්ණ අර්ථය ලියන්න.

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

9. ප්‍රසන්න කුසල චේතනාවලින් යුක්ත ව කරන ක්‍රියා කුසල වේ. යන අදහස ඇතුලත් ධම්ම පද ගාථාව ලියා එහි සම්පූර්ණ අර්ථය ලියන්න.

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

10. පහත විපාක බුදුරදුන්ට විඳීමට සිදුවූයේ කුමන හේතූන් නිසා දැයි ලියන්න.

I. සුන්දරී පරිබ්‍රාජිකාව මුල් කොටගත් සිදුවීම

II. චිංචිමානවිකාව පිළිබඳ සිදුවීම

III. බුදුරදුන්ට විටින් විට වැළඳුණු හිසේ රුදාව

IV. ලෝහිතපක්ඛන්දිකා රෝගය වැළඳීම

11. මුගලන් හිමි සොරුන්ගෙන් පහර කෑමට හේතුව ලියන්න.

12. යෝනිසෝමනසිකාරය යන්නෙහි අර්ථය ලියන්න.